www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නිදහස් සමරුව: මිලිටරි/පොලිස් රාජ්‍යයක නැගී ඒම

**Sri lanka's indipendence anniversary: the imergence of a militarty/police state**

## 2009 පෙබරවාරි 4

මෙම සතිය තුල ආරක්ෂක ලේකම් ගෝඨාභය රජපක්ෂ කොලඹදී විදේශ මාධ්‍යකරුවන්ට හා තානාපති වරුන්ට එරෙහිව එල්ල කල විවෘත තර්ජනය වනාහි, මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳ තවත් ලේ සීතල කරන සිහිගැන්වීමකි. ''ත්‍රස්තයට එරෙහි යුද්ධයක'' වහන්තරාව යටතේ ආන්ඩුව, සිල්ලටත් වඩා කම්කරු පන්තියට එරෙහිව එල්ල කල මිලිටරි/පොලිස් රාජ්‍යයක් සඳහා පදනම සකසමින් සිටියි.

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොයුරු ගෝඨාභය රාජපක්ෂ, හමුදාව විසින් එල්ටීටීඊයට එරෙහිව ගෙනයන කුරිරු යුද්ධය පිලිබඳ පුලුල් වන මාධ්‍ය ආවරනය කෙරෙහි එසේ ප්‍රතිචාර දැක්වීය. ආන්ඩුවේ දැඩි මාධ්‍ය වාරනය හමුවේ පවා, හමුදාවේ ඉවක් බවක් නැති ෂෙල් වෙඩි ප්‍රහාර මඟින් සිදුකෙරෙන ඝාතන හා විනාශය පිලිබඳව පලවූ වාර්තා, ඡායාරූප හා වීඩියෝ පට, ජාත්‍යන්තර වශයෙන් කෝපය හා විරෝධය දල්වා ඇත.

රාජපක්ෂ උනන්දු වන්නේ, වර්ගවාදී යුද්ධය සුජාත කිරිම සඳහා ගොතනු ලබන බේගල් ජාලයට තර්ජනයක් වන ඕනෑම දෙයක් කඩාකප්පල් කිරීමක් හා ද්‍රෝහී කමක් ලෙස හංවඩු ගැසීමට පමනි. සති අන්තයේ කල ප්‍රකාශයන්හිදී, වගකීම් විරහිත ලෙස කටයුතු කිරීම පිලිබඳව විදේශ තානාපතිවරුන්, ප්‍රවෘති ආයතන හා ජාත්‍යන්තර ආධාර සංවිධාන වෙත දෝෂාරෝපනය කරමින් ඔහු අනතුරු ඇඟවූයේ, යුද්ධය අඩු තක්සේරු කලහොත් ඔවුන්ට බරපතල ප්‍රතිවිපාකයන්ට මුහුන පෑමට සිදුවිය හැකි බවයි. ඔහු මෙසේ පැවසීය. '' දැවැන්ත වන්දියක් ගෙවමින් ආරක්ෂක හමුදා එල්ටීටීඊයට අවසාන මරු පහර එල්ල කරමින් සිටින මේ අවස්ථාවේ, ඔවුන්ට යලි හුස්ම ගැනීමේ අවස්ථාවක් ලබාදීමට උත්සාහ කරන කවරෙකු හෝ රටින් පලවාහරිනු ඇත. ''

සීඑන්එන්, අල්-ජසීරා හා විශේෂයෙන්ම බීබීසී ය ගැන සඳහන් කල රාජපක්ෂ, යුද්ධයට කොටුවී සිටින සිවිල් වැසියන් මුහුන පාන දුක් ගැහැට ගැන වාර්තා කිරීම පිලිබඳව ඔවුන්ට දොස් පැවරිය. එල්ටීටීඊය සිවිල් වැසියන් බලහත්කාරයෙන් මිනිස් පලිහක් ලෙස යොදා ගන්නා බවට ආන්ඩුව එල්ල කරන චෝදනා පුනරුච්ඡාරනය කරමින් රාජපක්ෂ, ඔවුන් මුදා හරින ලෙස ''ජාත්‍යන්තර ප්‍රජාව'' බලපෑම් තල යුතු බව කියා සිටියේය. ආන්ඩුවේ හඬ ප්‍රතිරාවය කිරීමට අසමත් වීම ගැන බීබීසී මාධ්‍යවේදී ක්‍රිස් මොරිස් විවේචනය කල රාජපක්ෂ, මෙසේ පැවසීය. ''වගකීමෙන් යුක්තව ක්‍රියා නොකලහොත් හා උසිගැන්වීම් සිදුකිරීමට උත්සාහ කලහොත් ඔහු රටින් නෙරපා හැරීමට සිදුවනු ඇත.''

මේ සතිය තුල බීබීසීය සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී රාජපක්ෂ එක හඬින් කියා සිටියේ මිනිසුන්''ත්‍රස්තවාදයට එරෙහිව සටන් වදින හා ත්‍රස්තවාදීන් වශයෙන් කන්ඩායම් දෙකකට පමනක් ගැනෙන'' බවයි. යුද්ධය පවතින විට ඊට එකඟ නොවීම හෝ එය විවේචනය කිරීම ද්‍රෝහීකමක් ලෙස සලකන්නේදැයි ඔහුගෙන් විමසූ විට ''ඔව් අපි අපගේ රට බේරාගැනීමට සටන් වදින්නෙමු'' යයි රාජපක්ෂ කඩා පැන්නේය. මෙම ප්‍රකාශ මඟින් සලකුනු කරන්නේ, මාධ්‍යවේදීන්ට, විරුද්ධ දේශපාලඥයන්ට, වැඩ වර්ජිත කම්කරුවන්ට, විරෝධතාවේ යෙදෙන ගොවීන්ට හා සිසුන්ට එරෙහිව ඔවුන්ගේ විවේචන කොතෙක් සීමිත ද යන්න නොතකා අඛන්ඩව එල්ල කෙරෙන ආන්ඩුවේ තර්ජන හා හෙලා දැකීම් පිටුපස ඇති ප්‍රතිගාමී තර්කනයයි.

ශ්‍රී ලංකාවේ ගැටුම ත්‍රස්තවාදවට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යුද්ධයක් නොවේ. එහි මූලයන් වැටී ඇත්තේ, සෑම බලයට පත් කොලඹ ආන්ඩුවක්ම කම්කරු පන්තිය බෙදා වෙන් කිරීමට දෙමල විරෝධී වර්ගවාදය ගසාකෑවේය යන කාරනය තුල ය. 2006 වසර මුල බලයට පැමිනීමෙන් පසුව, ජනාධිපති රාජපක්ෂ කුමන සම්මුතියක් හෝ ප්‍රතික්ෂේප කල අතර, එක්සත් ජනපදය හා අනෙකුත් මහා බලවතුන්ගේ පිටුබලය සහිතව 2002 වසරේ පටන් පැවති සටන් විරාමය සැහැසි ලෙස උල්ලංඝනය කරමින් නිර්ධය යුද්ධයක් යලි ආරම්භ කලේ, රටේ සිංහල ප්‍රභූ පැලැන්තියේ නිර්බාධිත අධිකාරය තහවුරු කර ගැනීමේ අරමුන ඇතිව ය.

විදේශ තානාපති වරුන්ට හා මාධ්‍යවේදීන්ට එරෙහිව ඔහුගේ සෙහොයුරාගේ උන්මාදනීය තර්ජන පිලිඹිඹු කරන්නේ, එල්ටීටීඊයේ මිලිටරි පරාජයෙන් පසුව දේශපාලන කැලඹීම් හා සමාජ අරගල රැල්ලක්

හටගනිතැයි කොලඹ පාලක කවයන් තුල පුලුල් ලෙස පැතිර ඇති භීතියයි. දැවැන්ත මිලිටරි වියදම් පියවා ගැනීම සඳහා ආන්ඩුව, ශ්‍රී ලංකා රාජ්‍යය එහි පතුලටම උකස් කර ඇති අතර යුද්ධයේ මුලු බර කම්කරු පන්තිය මත පටවා ඇත. දැන්, පෙර නොවූ විරූ ගෝලීය ආර්ථික අර්බුදයක බලපෑම හමුවේ, ඊට පාලන තන්ත්‍රය සතු කිසිදු පිලිතුරක් නොමැති තතු යටතේ විශේෂයෙන්ම කම්කරුවන්ගෙන් නැඟෙන විරෝධය පාගා දැමීමේ පොලිස් රාජ්‍ය පියවර ගැනීම හැරෙන්නට ඔවුනට වෙනත් විකල්පයක් ඇත්තේ නැත.

විදේශ මාධ්‍යවේදීන්, තානාපතිවරු හා ආධාර සේවකයන් නෙරපා හැරීමේ තර්ජන, දේශීය විවේචකයන්ට හා විරුද්ධවාදීන්ට එරෙහිව යොදාගෙන ඇති පියවරයන්හි හුදු පිලිඹිඹුවකි. විශේෂයෙන්ම මෙහිදී මාධ්‍ය ඉලක්ක කර ගෙන ඇත. පසුගිය මාසයේදී එම්ටීවී/සිරස රූපවාහිනී මධ්‍යස්ථානයේ කාර්යාල හා ඡායාරූප කුටි ආන්ඩුවේ ගැති ගුන්ඩන් කන්ඩායමක් විසින් වනසා දමා ගිනි තබන ලදී. දෙදිනකට පසුව සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග මෝටර් රියෙන් රැකියා ස්ථානයට යමින් සිටියදී මනාව සංවිධානයවූ ඝාතක කල්ලියක් විසින් කොලඹට නුදුරු ස්ථානයකදී මහ දවල් මරා දැමීය. ජනාධිපති රාජපක්ෂ බලයට ආ තැන් පටන් මාධ්‍යවේදීන් 9 ක් ඝාතනය කර 27 කට පහරදී ඇත. තවත් අය නඩු විභාගයකින් තොරව අත්තනෝමතික ලෙස සිර ගත කොට තිබේ. වික්‍රමතුංගගේ ඝාතනයෙන් පසුව ප්‍රකට මාධ්‍යවේදීන් දුසිමක් පමන රටෙන් පලාගියහ.

ආන්ඩුව හා ආරක්ෂක හමුදාවන් සමස්තයක් ලෙස දෙමල සුලුතරයට සලකනු ලබන්නේ සතුරෙකු ලෙසටය. බියවැද්දීම්, වද හිංසා පැමිනවීම් හා අත්තනෝමතික සිර භාරයේ තැබීම දෛනික දිවියේ කොටසක් බවට පත්ව තිබේ. හමුදා හා පොලිස් මාර්ග බාධක හා සෝදිසි කිරීමේ ස්ථාන ජාලයක් රට පුරා ක්‍රියාත්මකය. නගර හා තදාසන්නයේ දෙමල කොටස් අතර සිදු කරන පොලිස් හදිසි මෙහෙයුම් සාමාන්‍ය තත්වයකි. 2007 මැද භාගයේ එවන් සුවිශේෂී සිදුවීමකදී කොලඹ ජීවත්වන 350 කට වැඩි දෙමල මිනිසුන්, ගැහැනුන් හා ළමුන් පොලිසිය හා හමුදාව එක්ව වටලනු ලැබ බස් රථ වල පුරවා උතුරු නැඟෙනහිර යුද කලාපයට ගෙන ගොස් දැමීය. ''ජාතික ආරක්ෂාවේ'' නාමයෙන් ගෝඨාභය රාජපක්ෂ, තිරස්චීන ලෙස ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මෙසේ උල්ලංඝනය කිරීම ආරක්ෂා කලේ, එසේ පැහැරගත් මිනිසුන් දින නියමයකින් තොරව නඩු නොමැතිව සිරගත නොකිරීම සැබෑ පරහිතකාමය ලෙස පවා හඳුන්වා ගනිමිනි.

පසුගිය මාස 30 තුල ප්‍රමුඛ දේශපාලඥයන් ද ඇතුලු සිය ගනනක් පැහැරගෙනයාම්, ''අතුරුදහන්කිරීම්'' හා මරා දමා ඇති ඝාතක කල්ලිවල සැක කටයුතු වැඩ වඩාත් දුෂ්ඨ ය. අවම ලංසුවෙන් ගත් කල මෙම ඝාතන සිදුවූයේ ආරක්ෂක හමුදාවල නොතැකීම මධ්‍යයේ ය. හමුදා සාමාජිකයන් මේවාට ක්‍රියාශීලී ලෙස සම්බන්ධ බව ඕනෑවටත් වඩා පැහැදිලි දෙයකි. මාර්ග බාධක හා සෝදිසි මෙහෙයුම් සාමාන්‍ය තත්වයක් වන රටක නිතරම පාහේ මහරූ මෙම කල්ලිවලට නිදහසේ සැරි සැරීමට හැකිවී තිබේ. ප්‍රතිපල වශයෙන් අත් අඩංගුවට ගැනීම් සිදුවී ඇත්නම් ඒ පවා අතේ ඇඟිලි ගනනට නොවැඩි තරමක් පමනි.

හුදෙක් මෙම අමූලික අපරාධ හුදෙකලා සිදුවීම් නොව 25 වසරක සිවිල් යුද්ධය හා මුලු මහත් සමාජයම මිලිටරීකරනය වීම මඟින් පැටවූ ගසා ඇති දැවැන්ත මිලිටරි/පොලිස් පර්යායක වැඩ කටයුතුවල පිලිඹිඹුවකි. වර්තමානයේ පවතින ජාතික හැඳුනුම්පත් ක්‍රමය උඩට, ආරක්ෂක තන්ත්‍රයට සියලු පුරවැසියන්ගේ සුවිශාල දත්ත පදනමක් සපයන හමුදා ලියාපදිංචිකිරීමේ සැලැස්මක් පසුගිය මාසයේදී නිවේදනය කර තිබේ. නිත්‍ය මිලිටරි බලයක් ලෙස එල්ටීටීඊය මුලුමනින්ම පාහේ විනාශකරනු ලැබ පැවතිය ද ආන්ඩුව, දැනටමත් ලොව විශාලතම ඒක ජනක හමුදාව වන ශ්‍රී ලංකා හමුදාව 150000 සිට 200000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. නාවික හා ගුවන් හමුදාවලට 30000 බැගින් ද ග්‍රාමාරක්ෂක බලඇනියට 35000 ක ද සාමාජිකයන් සිටියි. මේ සියල්ල ඇත්තේ මිලියන 20 ක පමන ජනගහනයකින් යුත් රටක ය.

නැගී එන පොලිස් රාජ්‍යයක පැහැදිලිම සලකුනු දැක ගත හැක්කේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි ශ්‍රී ලංකාවේ මට්ටම් වලින් පවා අසමාන සතුරුභාවයක් පෙන්නුම් කරන වත්මන් ආන්ඩුවේ දේශපාලන දේහකාය තුලය. කොලඹ දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය රට සාමාන්‍යයෙන් ''ප්‍රජාතන්ත්‍රවාදී'' යයි හඳුන්වනු ලැබුව ද, පාර්ලිමේන්තු සංස්ථාවන් ප්‍රගාඪ පරිහානියකට පත්ව තිබේ. ප්‍රධාන දේශපාලන තීන්දු ගනු ලබන්නේ පාර්ලිමේන්තුවේදී හෝ කැබිනට් මන්ඩලයේදී පවා නොව ජනාධිපති රාජපක්ෂ වටකරගෙන සිටින මිලිටරි/දේශපාලන කල්ලියක් විසිනි. එය රාජපක්ෂගේ සහෝදරයන්, විශ්වාසදායක ආධාරකරුවන්, අතලොස්සක් ඇමතිවරු හා රටේ මිලිරි හා පොලිස් ලොක්කන්ට සීමාවී තිබේ.

ගෝඨාභය රාජපක්ෂ තෝරා පත්කර නොගත් නිලධරයෙක් වීමේ කාරනයම, මාධ්‍ය හා විරුද්ධ පක්ෂ විසින් අභියෝග නොකරන උමතු තර්ජන තානාපතිවරුනට හා මාධ්‍යවේදීන්ට එරෙහිව එල්ලකිරීමේ හැකියාව ඔහු වෙත ලබාදී තිබෙන අතර ජනාධිපති වටා ඇති කල්ලිය තුල සංකේන්ද්‍රනයවී ඇති බලය පිලිබඳව ද සාක්ෂි දරයි. ඔහුගේ සොයුරු ජනාධිපති රාජපක්ෂ රටේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යවස්ථාවෙහි අඩංගු අසාමාන්‍ය විධායක බලතල පරිපූර්නව ගසාකමින් සිටියි. ඔහු ආරක්ෂක හා මුදල් ඇමති තනතුරු ද දරන අතර එන්ට එන්ටම අඥාවන්

මඟින් පාලනය ගෙනයයි. ඊට අමතරව පුද්ගලයන් රඳවාගැනීම, පරිශ්‍රයන් සෝදිසි කිරීම, දේපල අත්පත්කර ගැනීම, වැඩ වර්ජන තහනම් කිරීම හා මාධ්‍ය වාරනය කිරීමට ඉඩ සලසාදී ඇති රටේ ත්‍රස්තවාදයට විරුද්ධ නීති හා දිගු කලක් තිස්සේ පවත්වාගෙන යන හදිසි නීති රෙගුලාසි යටතේ පුලුල් බලතල ඔහු සතුව ඇත.

ජනාධිපති රාජපක්ෂ හා ඔහුගේ කල්ලිය නීතිය, ව්‍යවස්ථාව හා අධිකරනය කෙරෙහි දක්වන්නේ පරම සතුරු භාවයකි. ඔහු සිය ගැත්තන්ගේ ජාලයෙහි කටයුතු වලට හරස්වීමේ හේතුව මත, ඉහල නිලධරයන් හා විනිශ්චයකරුවන්ගේ පත්වීම් නිරීක්ෂනය කරන ව්‍යවස්ථාදායක මන්ඩලයක් හා අනෙකුත් සංස්ථාවන් පිහිටුවීමට අවශ්‍යවන ව්‍යවස්ථා සංශෝධනය අනුව ක්‍රියාකිරීමට අපොහොසත්ව සිටියි. දෙසැම්බරයේදී ශ්‍රේෂ්ඨාධිකරනය පෙට්‍රල් මිල අඩුකරන ලෙසට දුන් නියෝගය ඔහු විසින් නොතකා හැරියා පමනක් නොව විනිශ්චයකරුවන්ගේ නිවාසවලට ගල් ගසනු ඇතැයි යන සියුම් ලෙස වසං කල තර්ජනයක් ද කලේය. පොලිස් රාජ්‍යයක සියලු අංග සූදානම්ව ඇත. තවමත් නැත්තේ නිමිත්තක් පමනි. එල්ටීටීඊයේ මිලිටරි ශක්තිය විනාශ කර දැමීමත් සමඟ, වේගයෙන් ගැඹුරු වන රටේ ආර්ථික අර්බුදය හා තව තවත් බර පැටවීමට එරෙහිව වැඩකරන ජනතාවගේ නැගිටීමක් මඟින් ඇතිකල හැකි ''හදිසි අවස්ථාවක'' රූපයෙන් එය පැමිනිය හැකිය.

බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයෙන් නිදහස්වීමේ 61 වන වසර කොලඹ දේශපාලන සංස්ථාපිතය විසින් සමරනු ලබන 2009 පෙබරවාරි 4 දිනයේ ශ්‍රී ලංකාවේ කෙරුවාවෙහි ස්වභාවය එසේ ය. මෙම දශකයන්හි සමස්ත ඉතිහාසය යලි යලිත් සනාථ කරනු ලැබ ඇත්තේ, ධනේශ්වර සංවර්ධනය කල් පසුවූ (ශ්‍රී ලංකාව වැනි) රටවල ධනේශ්වරය සාමාන්‍ය වැඩකරන ජනතාවගේ මූලික සමාජ අවශ්‍යතාවන් හා ප්‍රජාතන්ත්‍රීය අපේක්ෂාවන් ඉටුකිරීමෙහිලා ඓන්ද්‍රීයවම නොසමත් බව පෙන්නුම් කල ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවය පිලිබඳ න්‍යායෙහි මූලික ප්‍රස්තුතයයි. ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ''ලා සිය ආන්ඩුවේ ජයග්‍රහන පිලිබඳව අද දින හඬ නඟන ජනාධිපති රාජපක්ෂ, ශ්‍රී ලංකාවේ දූෂිත ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා රැකීම සඳහා නව ප්‍රහාරයක් දියත් කිරීමට සූදානම්ව සිටියි. මෙවර එය එල්ල කිරීමට නියමිතව ඇත්තේ වැඩකරන ජනතාවගේ සිංහල, දෙමල හා මුස්ලිම් යන සියල්ලන්ටම එරෙහිව ය.

මේ සැබෑම අන්තරායන් ඉස්මතු කරන්නේ ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය ගෙනගොස් ඇති අරගලයේ ප්‍රගාඪ වැදගත්කමයි. 1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ලෙස පිහිටවූ තැන් පටන් එය, එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය ද ඇතුලු ජාතිකවාදයේ හා වර්ගවාදයේ සියලු රූපාකාරයන්ට විරුද්ධවී ඇති අතර යුද්ධයට, පැතිර පවතින ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීමට හා ජීවන තත්වයන් මත එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව සියලු කම්කරුවන් ඒකාබද්ධ කිරීම සඳහා දුෂ්කර කොන්දේසි මධ්‍යයේ සටන් වැදුනි. දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් පිලිබඳ එහි ක්‍රියාමාර්ගය තුලින්, එකකින් පසුව තවත් එකක් වශයෙන් වැඩකරන ජනතාවට විනාශය ගෙන ආ වාර්ගික හා ජාතික ගැටුම් සහිත ශ්‍රී ලංකාවේ හා උප මහාද්වීපය පුරා කම්කරු පන්තියට අනාගතය සඳහා ඇති එකම ශක්‍ය මාවත ඉදිරිපත් කරයි.

**පීටර් සිමන්ඩ්ස්**